5 ශ්‍රේණිය සිංහල ගුරු අත් පොතට වැඩ පොත - අංක 12

Part ix

L10 S10 R10 W10

නිපුණතා ආවරණය - 2021

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

- ප්‍රාණවාචී හෝ අප්‍රාණවාචී හෝ නාම පද යෙදෙන වාක්‍යයක ක්‍රියා පදය යෙදෙන ආකාරය සාකච්ඡා කරයි. ලියයි.
- ස්ත්‍රී ලිංග නාමපද හෝ පුරුෂ ලිංග නාමපද හෝ වාක්‍යයක භාවිත වන ආකාරය විස්තර කරයි. ලියයි.
- නාම පදයක ඒකවචන සහ බහුවචන භේදය ප්‍රකාශ කරයි. ලියයි.
- සරල වාක්‍යයක උක්තය, කර්මය සහ ක්‍රියාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි. ලියයි.
- වාක්‍යයක යෙදෙන ආකාරය අනුව නාම පදයක උක්ත අනුක්ත භේදය ප්‍රකාශ කරයි. ලියයි.
- වර්තමාන කාල ප්‍රථම පුරුෂ හා උත්තම පුරුෂයට අදාළ ක්‍රියා පද භාවිතය ප්‍රකාශ කරයි. ලියයි.
- අතීත කාල ප්‍රථම පුරුෂයට හා උත්තම පුරුෂයට අදාළ ක්‍රියා පද ප්‍රකාශ කරයි. ලියයි.
- ද/ත්/යි/හා/සහ යන්න යොදා එකතුවන නාමපද කිහිපයක් උක්තය ලෙස යෙදුණු වාක්‍යවල නිවැරදි භාවිතය විස්තර කරයි. ලියයි.
- අක්ෂර වින්‍යාසයේ නිවැරදි භාවිතය පිළිබඳ සාකච්ඡා කරයි. ලියයි.

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

"ඈ/ඇය" යෙදුණු අතීත කාල වාක්‍ය

- බොහෝ විට ප්‍රාණවාචී ස්ත්‍රී ලිංග අතීත කාල ඒකවචන උක්ත පද සමඟ යෙදෙන ක්‍රියා පදය "ආය" ලෙස අවසන් වේ. ස්ත්‍රී ලිංග උක්ත පදයක් කිහිප වරක් යෙදෙන අවස්ථාවල දී ඒ වෙනුවට "ඈ/ඇය" භාවිත කරන නිසා ඒ සමඟ යෙදෙන ක්‍රියා පදය ද "ආය" ලෙස අවසන් වේ. පහත සඳහන් එක් එක් වාක්‍යවල ඈ/ඇය යන ස්ත්‍රී ලිංග ඒකවචන උක්ත පදය සහ එයට අදාල අතීත කාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

1. ඈ/ඇය පිරිසිදු ඇඳුම් අඳියි.
   ඈ/ඇය පිරිසිදු ඇඳුම් ඇන්දා ය.
2. ඈ/ඇය පිළිවෙළකට ජීවත් වෙයි.
   ඈ/ඇය පිළිවෙළකට ජීවත් වූවා ය.
3. ඈ/ඇය කවි, ගීත නිර්මාණය කරයි.
   ඈ/ඇය කවි, ගීත නිර්මාණය කළා ය.
4. ඈ/ඇය ගීතයේ තාලයට නටයි.
   ඈ/ඇය ගීතයේ තාලයට නැටුවා ය.
5. ඈ/ඇය තම නිවස පිරිසිදු ව තබා ගනියි.
   ඈ/ඇය තම නිවස පිරිසිදු ව තබා ගත්තා ය.

- පහත ඡේදයේ සඳහන් එක් එක් වාක්‍යවල ඒකවචන ඈ/ඇය යන ස්ත්‍රී ලිංග උක්ත පදය සහ එයට අදාල අතීත කාල ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

මගේ අක්කා

මගේ අක්කා අම්මා සමඟ විවිධ කෑම වර්ග සෑදුවා ය. දිනක් අම්මා සීයාගේ නිවසට ගියා ය. එදින අප සැම දෙනාට ම කෑම පිළියෙල කරන්නට සිදු වූයේ මගේ අක්කාට යි. ඈ උදෑසනින් ම අවදි වූවා ය. ඇය අපට උදෑසන ආහාරය සඳහා මුං කිරිබත් සෑදුවා ය. ඈ ඒවා අප සැමට පිළිගැන්වූවා ය. මුං කිරිබත්වල රසය පිළිබඳ ව අප කතා කරන විට ඇය ඒ සියල්ල ආශාවෙන් අසා සිටියා ය.

උදේ 11.00 පමණ වන විට අක්කා අපට පලතුරු බීමක් සාදා දුන්නා ය. අනතුරු ව ඇය දිවා ආහාරය සකස් කිරීමට සූදානම් වූවා ය. ඈ බත් ඉවුවා ය. මාළු මිරිසට උයා පොළොස් ව්‍යංජනයකුත් පරිප්පු ව්‍යංජනයකුත් ගොටු කොළ සලාදයකුත් ඇය පිළියෙල කළා ය.දිවා ආහාරය ගන්නා විට අම්මා ද නිවසට පැමිණියා ය. අම්මා ද අක්කාගේ දිවා ආහාර වේල ආසාවෙන් රස විඳින්නා ය. අක්කාගේ කෑමවල රසය අපි සැම දෙනා ම අගය කළෙමු.

- වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.

1. ඇය උදෑසනින් ම අවදි වෙයි.
2. ඈ උදෑසනින් ම අවදි වූවා ය.
3. ඈ පිරිසිදු ජලය පානය කරයි.
4. ඈ පිරිසිදු ජලය පානය කළා ය.
5. ඈ තම පොත් මේසය පිළිවෙළකට සකස් කරයි.
6. ඈ තම පොත් මේසය පිළිවෙළකට සකස් කළා ය.
7. ඇය විවේකය ඵලදායි ව ගත කරයි.
8. ඇය විවේකය ඵලදායි ව ගත කළා ය.
9. ඇය සැමට කරුණාව දක්වයි.
10. ඇය සැමට කරුණාව දැක්වූවා ය.
11. ඈ දිනපතා උදෑසනින් අවදි වූවා ය.
12. ඈ කවි පොතක් රචනා කරයි.
13. ඇය වේදිකා නාට්‍යයක් නරඹයි.
14. ඇය රෑ අහස සිතුවමට නැඟුවා ය.
15. ඈ බුද්ධිමත් ලෙස ක්‍රියා කරයි.

16. ඇය සැම දෙනාට එක හා සමාන ව සැලකුවා ය.
17. ඇය ගීත රස විඳීමට බෙහෙවින් ප්‍රිය කළා ය.
18. ඈ නිර්මාණශීලී අදහස්වලින් යුතු වූවා ය.
19. ඇය සෞඛ්‍යවත් ජීවිතයක් ගත කරයි.
20. ඇය පවිත්‍රතාව පිළිබඳ ව ඉහළින් සැලකුවා ය.

❖ වර්තමාන කාල වාක්‍ය

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

❖ අතීත කාල වාක්‍ය

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

. . . . . .

- පහත දී ඇති වාක්‍යවලට ගැළපෙන සේ වර්තමාන කාල වාක්‍ය හෝ අතීත කාල වාක්‍ය හෝ ලියන්න.

1. ඇය සංගීතයට බොහෝ සේ ප්‍රිය කරයි.

2. . . . . .

3. ඈ කිසි දිනෙක වැරදි ක්‍රියා සිදු නොකළ යුතු දේ හෙටට කල් නො දමයි.

4. . . . . .

5. ඈ සමබර ආහාර වේලක් ගත්තා ය.

6. . . . . .

7. ඇය අද කළ යුතු දේ හෙටට කල් නො දමයි

8. . . . . .

9. ඈ සැම විට ප්‍රිය වචන කතා කළා ය.

10. . . . . .

- පළමු වාක්‍ය තුන කියවා එම රටාව අවබෝධ කරගෙන දී ඇති හිස්තැනෙහි "ඈ/ඇය" යොදා නිදහසේ වෙනත් වාක්‍ය ගොඩනඟා ලියන්න.

<u>කාව්‍යා</u>

කාව්‍යා මගේ මිතුරියකි.
ඈ උද්‍යෝගයෙන් යුතු ව පාසල් වැඩ කළා ය.
ඇය පන්තියේ ඉහළ ලකුණු ලබා ගත්තා ය.

<u>සවිනි</u>

. . . . . .

. . . . . .

. . . . . .

<u>මගේ නැන්දා</u>

මගේ නැන්දා ක්‍රියාශීලී කාන්තාවකි.
ඈ සැම විට ම කුමක් හෝ වැඩක යෙදුණා ය.
ඇය අපට රසවත් කෑම සාදා දුන්නා ය.

<u>මගේ ලොකු අම්මා</u>

. . . . . .

. . . . . .

. . . . . .

<u>අක්කා</u>

මගේ අක්කා ඥානවන්ත යි.
ඈ උනන්දුවෙන් යුතු ව අධ්‍යාපන කටයුතුවල යෙදුණා ය.
ඇය නිකරුණේ කාලය ගත නොකළා ය.

<u>නංගී</u>

. . . . . .

. . . . . .

. . . . . .

<u>පුනරීක්ෂණ ඒකකය: 1</u>
<u>මහපටැඟිල්ලක අරුමය</u>

- ඡේදය කියවා පිළිතුරු ලියන්න.

අත්ලේ ඇට කැබලි හැදිලා තියෙන හැටි බින්දු සෝදිසි කළා. ඇට කැබලි 27 ක් අත්ල පුරා විහිදිලා තියෙනවා. අත්ලේ මැද ඇට කැබලි 13 යි. අනෙක් ඒවා ඇඟිලි වල තියෙන්නේ. මහපටැඟිල්ලේ ඇට කැබලි 2 යි. අනෙක් හැම ඇඟිල්ලක ම ඇට කැබලි 3 බැගින් ඇට කැබලි 12 ක් තියෙනවා. මහපටැඟිල්ල අත්ලේ ඇට වලට සවි වන තැන ටිකක් වෙනස්. ඉදිරියටත් පසුපසටත් විතරක් නොවෙයි, දෙපැත්තටත් ඒ ඇඟිල්ල සොලවන්න පහසුයි. ඒත් අනෙක් ඇඟිලි ඒ ආකාරයට සොලවන්න අපහසුයි.

1) මහපටැඟිල්ලේ විශේෂත්වය කුමක් ද?

. . . . . .

2) අත්ල පුරා විහිදී ඇති ඇට කැබලි ගණන කොපමණ ද?

. . . . . .

3) මහපටැඟිල්ලේ ඇති ඇට කැබලි ගණන කොපමණ ද?

. . . . . .

4) අනෙක් ඇඟිලි වල ඇත්තේ ඇට කැබලි කීය බැගින් ද?

. . . . . .

5) විරුද්ධාර්ථ පද ඡේදයෙන් සොයා ලියන්න.

1) ඉදිරියටත් - . . . . . .

2) පහසුයි - . . . . . .

6) මහපටැඟිල්ලෙන් කර ගත හැකි කාර්යයන් 3 ක් ලියන්න.

. . . . . .

. . . . . .

. . . . . .

7) පහත පිළි යෙදුණු වචන තුන බැගින් ලියන්න.

1) දික් ඇඳපිල්ල - . . . . . .

2) දික් ඉස්පිල්ල - . . . . . .

3) පා පිල්ල - . . . . . .

4) කොම්බුව සහ ඇලපිල්ල - . . . . . .

. . . . . .